
# කැලිකසළ හා නීතිය



නීතීඥ රවින්ද්‍රනාත් දබරේ
(පරිසර පදනමේ හිටපු ජ්‍යෙෂ්ඨ නීති නිලධාරි සහ අධිකරණ අමාත්‍යාංශයේ ප්‍රජා නීති නිලධාරි)

**අපට පෞද්ගලිකව මුහුණ දීමට සිදුවන යම් යම් අපහසුතාවන්, අවාසි සහගත, කරදරකාරී තත්ත්වයන් මගහරවා ගැනීමට යම් යම් සීමාවන් අප විසින් ම පනවා ගෙන තිබේ. අප පරාර්ථකාමී නොවී ආත්මාර්ථයටම තැනදී තිබෙන්නේත් අපේ සුබ විහරණය පමණක් අපේක්ෂා කරන නිසාය.**

දැනට උග්‍ර සමාජ ප්‍රශ්නයක් බවට පත් වී තිබෙන කැලිකසළ ප්‍රශ්නය දෙසත් විමර්ශනාත්මක ඇසකින් බැලුවහොත් ඊට හේතු වී ඇත්තේත් අප, අප ගැනම පමණක් කල්පනා කිරීම බව තේරුම් ගැනීමට අපහසු නොවේ.

සැම කෙනෙක්ම තමන් ගැන පමණක් සිතූ විට කුඩා ප්‍රශ්නයක් වුවත් ඔඩුදුවන පිළිකාවක් මෙන් සංකීර්ණ විය හැකියි. අපේ කුණු අපට එපා යැයි සිතා තම කුණු මල්ල අල්ලපු වත්තට විසි කරන්නට පෙළඹුණු සමාජයක මේ පොදු ප්‍රශ්නය දෙස වගකීමෙන් බලන්නට ඉදිරිපත් වී සිටින්නේ ස්වල්ප දෙනෙක් පමණයි. කෙසේ නමුත් පරිසරය පොදු දයාදයක් නිසා ඒ ගැන සිතන්නටත් බොහෝ දෙනෙකුට කාල වේලාවක් නැත.

කැලිකසළ නිසා අප පරිසරයට කර තිබෙන හානියට ස්වභාවධර්මයේ නීතියෙන් අපට දඬුවම් ලැබෙන එක වැළැක්විය නොහැකිය. එසේම කැලිකසළ සම්බන්ධයෙන් රටක පිළිගත් නීතිමය අංශයක් ද තිබේ. පරිසරයට හානි කිරීමට කිසිවකුටත් අයිතියක් නැත. අපේ රටේද නීති, ව්‍යවස්ථාවල ද මේ සම්බන්ධ කරුණු ගණනාවක් අන්තර්ගත වේ. එහිදී පාරිසරික නීතිය යටතේ කැලිකසළ සම්බන්ධයෙන් පවතින වගකීම් හා කාර්යභාරයන්, ඒවා කඩ කිරීමේදී ලැබෙන දඬුවම් ආදිය පිළිබඳවත් පැහැදිලි විස්තර ඇතුළත් වේ.

කැලිකසළ මගින් පරිසරය අපවිත්‍ර කරන පිරිස්වලට එරෙහිව නීතිමය පියවර ගැනීමේදී දණ්ඩ නීති සංග්‍රහය මෙන්ම අපරාධ නඩු විධාන

කැලිකසළ නිසා අප
පරිසරයට කර තිබෙන
හානියට ස්වභාවධර්මයේ
නීතියෙන් අපට දඬුවම්
ලැබෙන එක වැළැක්විය
නොහැකිය. එසේම
කැලිකසළ සම්බන්ධයෙන්
රටක පිළිගත් නීතිමය
අංශයක් ද තිබේ.
පරිසරයට හානි කිරීමට
කිසිවකුටත් අයිතියක් නැත.
අපේ රටේද නීති,
ව්‍යවස්ථාවල ද
මේ සම්බන්ධ කරුණු
ගණනාවක් අන්තර්ගත වේ.



සංග්‍රහයත් වැදගත් වේ. මෙහිදී රටේ නීතිය හා සාමය ආරක්ෂා කිරීමට අමතරව පොලිසියට කැලිකසළ සම්බන්ධයෙන් ද නීතිමය දඬුවම් ලබා දිය හැකිසි. දණ්ඩ නීති සංග්‍රහයේ එන 261, 262, 266, 270, 271, 277 යන වගන්ති යටතේ නීතිය ක්‍රියාත්මක කළ හැකිසි.

කැලිකසළ හේතුවෙන් ඇති වී තිබෙන ජාතික ප්‍රශ්නයට නීතිමය වශයෙන් විසඳුම් සෙවීමට නම් ඒ සඳහා අවශ්‍ය කෙරෙන නෛතික බලතල ඕනෑතරම් තිබේ. ගැටළුවකට ඇත්තේ ඒවා නිසි අයුරින් ක්‍රියාත්මක නොවීමයි. උදහරණයක් හැටියට දණ්ඩ නීති සංග්‍රහය ගත් විට එහි 262 වගන්තියේ සඳහන් වන්නේ,

**"ජීවිතයට අන්තරාදයක වූ යම් රෝගයක් පැතිරවිය හැකි වූද එලෙස පැතිරවිය හැකි බව තමා දන්නා වූ හෝ එලෙස විශ්වාස කිරීමට කරුණු \;බන්නා වූද යම් ක්‍රියාවක් නීති විරෝධීව හෝ නොසැළකිලිමත් ව කරන තැනැත්තකුට හය (06) මාසය දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතුය."**

"මීට අමතරව 261 වගන්තිය අනුව මහජන **කරදරය කිරීමේ වරද යටතේත්,** 263 වගන්තියට අනුව **ජීවිතයට අන්තරාදයක වූ රෝගයක බෝවීම පැතිරවිය හැකි ද්වේශ සහගත ක්‍රියාව යන වරද යටතේත්,** 270 වගන්තියට අනුව පොදු **උල්පතක හෝ ජලාශයක ජලය අපවිත්‍ර කිරීම යන වරද යටතේ සහ** 271 ට අනුව යම් තැනැත්තකුගේ **සතීපයට අන්තරාදයක වන පරිදි යම් ස්ථානයක වාතාවරණය කැමැත්තෙන්ම දූෂණය කිරීම යන වරද යටතේත් දඬුවම් ලබා දිය හැකිසි."**

පරිසරයටත්, ජනතාවටත් අහිතකර ලෙස බලපා තිබෙන කැලිකසළ අර්බුදයට නීතිමය විසඳුම් සෙවීමේදී, නීතිය උල්ලංඝනය කරන්නවුන්ට එරෙහිව කටයුතු කිරීම කාලීන අවශ්‍යතාවක් බවට පත් වී ඇත. වර්තමානයේ අප රටේ බහුලව තඩු පැවරීම කර ඇත්තේ අපරාධ නඩු විධාන සංග්‍රහයට අනුකූලවයි. එහිදී 98 වැනි වගන්තිය විශේෂිතයි. මෙම වගන්තිය අනුව **"කිසියම් ක්‍රියාවක් මහජනතාවට පීඩාවක් වන්නේ නම් සෞඛ්‍ය හා සතීපාරක්ෂාවට හානියක් නම්**

**අපට හානියක් සිදුවන අවස්ථාවකදී පවා ඇස කන පියාගෙන සිටින්නට අපි පුරුදුවී සිටිමු. කැලිකසළ ප්‍රශ්නයටත් සිදුවී ඇත්තේ ද එයමය. අපට හානිදයක වන පරිදි යම් ස්ථානයක කැලිකසළ අනවසරයෙන් ගොඩගසා ඇත්නම් ඒ සම්බන්ධයෙන් වගකිව යුතු පිරිස්වලට එරෙහිව නඩු පැවරීමට පිළිවන.**

**එම පීඩාව නැති කිරීමට ආඥාවක් නිකුත් කිරීමට මහේස්ත්‍රාත් අධිකරණයට බලය තිබේ."** තවද වගඋත්තරකරුවන් කැඳවීමකින් තොරව නඩුව ගොනු කළ විගසම ආඥාවක් නිකුත් කිරීමට මහේස්ත්‍රාත්වරයාට බලය ඇත.

නීතිය පොත්වලට පමණක් සීමා වීමෙන් පලක් නැත. නීතිය ප්‍රායෝගිකත්වයට පත් වන්නේ ක්‍රියාත්මකවීමත් සමඟය. ඇත්තෙන්ම කැලිකසළ ප්‍රශ්නය ගත්විට මේ සම්බන්ධව නීතියක් පවතිනවාද, වැරැදිකරුවන්ට දඬුවම් ලබා දිය හැකිද යන්න ගැනවත් ඇතැමුන් දන්නේ නැත. සාමාන්‍ය ජනතාව කෙසේ වෙතත් වගකිව යුතු පිරිස්වත් මේ ගැන දැනුවත් වී නොමැත.

අපට හානියක් සිදුවන අවස්ථාවකදී පවා ඇස කන පියාගෙන සිටින්නට අපි පුරුදුවී සිටිමු. කැලිකසළ ප්‍රශ්නයටත් සිදුවී ඇත්තේ ද එයමය. අපට හානිදයක වන පරිදි යම් ස්ථානයක කැලිකසළ අනවසරයෙන් ගොඩගසා ඇත්නම් ඒ සම්බන්ධයෙන් වගකිව යුතු පිරිස්වලට එරෙහිව නඩු පැවරීමට පිළිවන. මෙහිදී නීතියේ ඉතාමත් පැහැදිලිව දක්වා ඇති පරිදි යම් පුද්ගලයකුට පෞද්ගලිකවම තොරතුරු වාර්තාවක් සකසා මහේස්ත්‍රාත්වරයාට ඉදිරිපත් කිරීම පමණක් ම ඒ සඳහා ප්‍රමාණවත් වේ.





**පරිසරයට තර්ජනයක් වන අයුරින් කටයුතු කිරීම නීතිය ඉදිරියේ දඬුවම් ලැබිය හැකි වරදකි. ඒ වගේම වගකිව යුතු ආයතන ඒ සම්බන්ධයෙන් කටයුතු නොකළහොත් ඔවුන්ට එරෙහිව ද නීතිය ක්‍රියාත්මක කළ හැකියි. මෙහිදී පීඩාවට සෘජුව භාජනය නොවන පිටස්තර කෙනෙකුට වුවද ඉදිරියට යා හැකියි.**

ගම්බද පෙදෙස්වලට වඩා නාගරිකව උග්‍ර තර්ජනයක් වී ඇති කැලිකසළ ප්‍රශ්නයට බලපා තිබෙන ප්‍රධානතම හේතුවක් වී ඇත්තේ තමන්ට පැවරී තිබෙන වගකීම හරිහැටි තේරුම් ගෙන නොමැති වීමයි. ඇතැම් ආයතන හා නිලධාරීන් තවත් ආයතනයකට දෙස් පවරා ප්‍රශ්නයෙන් කර අරියි. කැලිකසළ අනවසරයෙන් බැහැරලීම, පරිසරයට එමගින් හානි කිරීම යන වැරැදි කරන පිරිස් වලට එරෙහිව කටයුතු කිරීමට පොලිසියට, නගර සභාවලට, පළාත්පාලන ආයතනවලට බලය ඇත. ඒ වගේම මෙම ආයතන තම කාර්ය හරිහැටි ඉටු කරන්නේ නැතිනම් ඔවුන්ට එරෙහිව කටයුතු කිරීමට මහජනතාවට බලය ඇත.

කැලිකසළ ප්‍රශ්නයේ දී ඇතැමුන් පවසන්නේ අවශ්‍ය කරන නීතිමය බලතල තමන්ට නැති බවයි. නමුත් පවතින නීතිය හරිහැටි ක්‍රියාවට නංවන්නේ නම් මේ ප්‍රශ්නය පාලනය කළ හැකියි. **මහ නගර සභා ආඥා පනත, නගරසභා ආඥාපනත, රෝග නිරෝධායන ආඥාපනත යටතේ අදාළ නිලධාරීන්ට බලපත්‍රයක් රහිතව ඕනෑම ස්ථානයක් පරීක්ෂා කිරීමට පවා බලය ඇත.**

පරිසරය ආරක්ෂා කිරීමේ පැරණිම ආඥාපනත 1862 දී පනවන ලද අනදරය පිළිබඳ ආඥා පනතයි. ඊට අනුව අප ජීවත්වන නිවෙස අපවිත්‍රව තබා ගන්නේ නම් ඊට එරෙහිව පවා නඩු පැවරිය හැකියි.

ජාතික අර්බුදවලදී මධ්‍යම රජයේ මැදිහත්වීම අත්‍යවශ්‍යයි. කැලිකසළ වැනි පාරිසරික ප්‍රශ්න නිරාකරණය කරගැනීමේ මධ්‍යම රජයේ දායකත්වය ක්‍රියාවට නංවන්නේ මධ්‍යම පරිසර අධිකාරිය මගිනි.

නිවෙස්වලින්, කර්මාන්තශාලාවලින් ඉවතලන කසළ හා අපද්‍රව්‍ය ක්‍රමවත් ලෙස බැහැරලීමට නිසි ක්‍රියාමාර්ග හා සැලසුම් සැකසිය යුත්තේ වගකිවයුතු ආයතනයි. නමුත් ඇතැම් ආයතන වලට ක්‍රමවත් වැඩපිළිවෙළක් නැත. සමහර නගර සභා සහ පළාත් පාලන ආයතන මගින් කසළ බැහැර කිරීමට තෝරාගෙන ඇත්තේ ප්‍රසිද්ධ ජනාකීර්ණ ස්ථානයි. එසේ ගොඩ ගැසීමෙන් අනතුරුව සිදුවන හානියට ඔවුන් ළඟ විසඳුම් නැත. නමුත් තම වගකීමෙන් බැහැරවීමට කිසිවකුටත් අයිතියක් නැත. අත්තිඩිය ප්‍රදේශයේ කුණුකසළ බැහැරලීමට විරුද්ධව දෙහිවල – ගල්කිස්ස මහනගර සභාවට එරෙහිව පැවරූ නඩුව උදහරණයක් ලෙස දැක්විය හැකියි.

එහිදී නඩුව විභාග කළ අධිකරණය නගර සභාවේ ක්‍රියාව අත්හිටුවීමට නියෝග කළ අතර ඊට එරෙහිව නගර සභාව විසින් කොළඹ මහාධිකරණයට පැමිණිලි කළද එය නිශ්ප්‍රභ විය.

පරිසරයට තර්ජනයක් වන අයුරින් කටයුතු කිරීම නීතිය ඉදිරියේ දඬුවම් ලැබිය හැකි වරදකි. ඒ වගේම වගකිව යුතු ආයතන ඒ සම්බන්ධයෙන් කටයුතු නොකළහොත් ඔවුන්ට එරෙහිව ද නීතිය ක්‍රියාත්මක කළ හැකියි. මෙහිදී පීඩාවට සෘජුව භාජනය නොවන පිටස්තර කෙනෙකුට වුවද ඉදිරියට යා හැකියි. **නඩු අංක 4544 යටතේ විභාගයට ගැනුණු සේදවත්තේ කන්ටේනර් සම්බන්ධ නඩුව මීට හොඳ පූර්වාදර්ශයක් විය. මෙහි වග උත්තරකරුවන් කර තිබුණේ පොලිස්පති, මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති, වරාය අධිකාරිය සහ රේගු අධ්‍යක්ෂවරයා යි.**

කැලිකසළ හේතුවෙන් ඇති වී තිබෙන පාරිසරික ප්‍රශ්නය මුලිනුපුටා දැමීමේදී පරිසර නීතිය කඩ කරන පිරිස්වලට දඬුවම් ලබා දීමටත් පියවර ගත යුතුයි. නමුත් මේ කාරණයේදී නීතියේ සඳහන් කරුණු අදට කිසිසේත්ම ප්‍රමාණවත් නොවන බව නම් කිව යුතුය. මේ නිසා ඇතැම් කරුණු සංශෝධනය විය යුතුව තිබේ. මීට හොඳම නිදසුන වන්නේ දණ්ඩ නීති සංග්‍රහයේ එන 271 වැනි වගන්තියයි. එහි සඳහන් වන්නේ "......... යම් ස්ථානයක වාතාවරණය කැමැත්තෙන්ම දූෂණය කරන තැනැත්තකුට රුපියල් සියය දක්වා දඩයකින් දඬුවම් කළ යුතුය" යනුවෙනි.

එසේම කෙනෙකුගේ ජීවිතයට අන්තරාදයක වන පරිදි කැලිකසළ බැහැර කරන පිරිස්වලට එරෙහිව කටයුතු කිරීමට තමන්ට තිබෙන නීතිමය බලතල ගැන තමන්ම දන්නේ නැත. මේ නිසාම එම නීතියේ භාවිතය ඇල්මැරුණු ස්වභාවයක් ගෙන ඇත. උදහරණයක් ලෙස සෑම පොලිස් ස්ථානයකම "පාරිසරික අංශයක්" පිහිටුවා තිබේ. නමුත් ඇතැම් පොලිස් නිලධාරීන් පවා ඒ ගැන නොදනී. මේ නිසා වගකිවයුතු නිලධාරීන් හා ආයතන දැනුවත් කිරීමට ද අද ක්ෂණික පියවර ගත යුතුව තිබේ.

තමන්ගේ යහපත මෙන්ම අන් අයගේ යහපත වෙනුවෙන් ද කටයුතු කිරීමට තමන්ට පැවරී ඇති වගකීම බොහෝ දෙනෙක් සිතා මතාම අමතක කර තිබේ. නමුත් නීතියටත් දඬුවමටත් ඇති බිය නිසා යම් තරමකට හෝ මේ සමාජය නිවැරැදි මාර්ගයට ගැනීමට හැකි වී තිබෙන බව නොරහසකි. එහෙයින් කැලිකසළ ප්‍රශ්නයටත් තිරසාර විසඳුමක් සෙවීමේදී නීතිමය අංශය ද කාලයට ගැලපෙන ලෙස ක්‍රියාවේ යෙදවීම අත්‍යවශ්‍ය කරුණක් වී ඇත.

**සාකච්ඡා කළේ -**
**ප්‍රියදර්ශනී සකුන්තලා ජයසිංහ**